ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

**පුවත්පත් නිවේදනය**

**ශ්‍රී ලංකාවේ ප්‍රථම ගුවන් නියමුවරියන් පත් කිරීම සම්බන්ධයෙන් ඉන්දියාවෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සුබ පැතුම්**

ADPL ගුණරත්න සහ RT වීරවර්ධන යන නිලධාරිනියන් දෙපළ නොවැම්බර් 16 වන දින ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රථම ගුවන් නියමුවරියන් දෙදෙනා ලෙස පත් වීම ශ්‍රී ලංකාවට මෙන්ම ඉන්දියාවටද මහත් ආඩම්බරයක් සහ සතුටට කරුණක් වේ. මෙම නිලධාරිනියන් දෙපළ 2018 ජූලි සිට 2019 ජූනි දක්වා හයිද්‍රාබාද් හි ඉන්දීය ගුවන් හමුදා ඇකඩමියේ 204 වන ගුවන් නියමු පාඨමාලාවෙන් පුහුණුව ලැබූ නිලධාරිනියන් දෙපළකි.

පුහුණු වීම් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින ද්විපාර්ශවික ආරක්ෂක සහයෝගීතාවයේ ශක්තමත්ම අංගයකි. ඉන්දියාව විදේශ රට වලට ලබා දෙන හමුදා පුහුණු අවස්ථාවන්ගෙන් අඩකටත් වඩා ලබා දෙන්නේ ශ්‍රී ලංකාවට වේ. වාර්ෂිකව ශ්‍රී ලංකා හමුදා සාමාජිකයන් 1200කට අධික පිරිසක් ඉන්දියාවේ පුහුණුවීම් වලට සහභාගී වේ. මෙයින් ආසන්න වශයෙන් 250ක් පමණ ශ්‍රී ලංකා ගුවන් හමුදා සාමාජිකයන් වේ. මෙම ඒකාබද්ධ පුහුණු වීම් අප දෙරටෙහි ආරක්ෂක අභිලාෂයන් ආරක්ෂා කර ගැනීමට සහ කලාපීය සාමය සහ ආරක්ෂාව තහවුරු කිරීම උදෙසා ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර මිත්‍රත්වය ශක්තිමත් කිරීමට ඉවහල් වේ.

*****

කොළඹ

ශක වර්ෂ 1942 කාර්තික 27

2020 නොවැම්බර් 18